*Archaeologia (2004) : 106 - 119*

# ශ්‍රී ලංකාවේ පැරණි කාන්තාව : සෙල්ලිපි ආශ්‍රිත අධ්‍යයනයක්

**ශ්‍රියානි හතුරුසිංහ**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
e mail: srivanihaturusinghe@yahoo.com

## හැඳින්වීම

කාන්තාව සමාජ පද්ධතියේ ප්‍රධාන චරිතයකි. ඇය විවිධ අවස්ථාවල විවිධ භූමිකාවන් ගනිමින් සමාජ සම්බන්ධතා ජාලය සැකසීමට දායක වී සිටින අතර ඇයගේ තත්ත්වය කාලීන වශයෙන් වෙනස්වීම්වලට භාජනය වී තිබේ. ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ ජීවත් වූ කාන්තාව ගේ සමාජ තත්ත්වය පිළිබඳව අධ්‍යයනයක් මේ ලිපියෙන් ඉදිරිපත් කෙරේ. පැරණි සමාජයේ ජීවත් වූ කාන්තාවන් පිළිබඳ තොරතුරු ඓතිහාසික මූලාශ්‍ර, සාහිත්‍ය මූලාශ්‍ර සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවල සඳහන් වුවත් මෙම අධ්‍යයනයේ දී සෙල්ලිපිවල ඇතුළත් කරුණු පමණක් මූලාශ්‍ර කොට ගනිමි. ඇතැම් අවස්ථාවල මේ තොරතුරු කාන්තාව පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ගොඩනගා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ. එවැනි සෙල්ලිපි ප්‍රමාණය සීමිත වීමත් ඒවා කෙටි වීමත් එයට හේතු වේ. කෙසේ වුවද සෙල්ලිපි සමකාලීන සමාජය නියෝජනය කිරීමත්, ඒවා සංස්කරණය කිරීමට අපහසු වීමත් නිසා විශ්වාසදායී මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකි ය. ශිලාලිපිවල සඳහන් තොරතුරු අනුව පැරණි කාන්තාවගේ සමාජ, ආර්ථික, දේශපාලන සහ ආගමික කටයුතු යම්තාක් දුරකට හෙළිදරව් කිරීමට හැකි විය.

## සමාජීය තත්ත්වය

පැරණි ශ්‍රී ලංකාවේ පවුල පියා, මව හා දූ දරුවන්ගෙන් සමන්විත වේ. පවුල තුළ දී කාන්තාව මවක්, බිරිඳක්, දියණියක් සහ සොහොයුරියක් ලෙස කටයුතු කළ බව දක්නට ලැබේ. එහි දී මවක්, බිරිඳක් සහ දියණියක් ලෙස විශේෂ ගෞරවාදරයට පාත්‍ර වූ බව ද සෙල්ලිපි අනුව පෙනී යයි. නමුත් සෙල්ලිපි ආකෘතිය අනුව පවුලේ මූලිකත්වය පීතෘත්වයට ලැබී තිබේ. සෙල්ලිපි බොහොමයක ස්වාමියා හෝ පියා හඳුන්වාදීමෙන් පසුව බිරිඳ හෝ දියණිය සඳහන් කිරීමෙන් මේ බව පැහැදිලි වේ. "ගමික අනුදි කඩය උපසික ශොනය ලෙනේ" (Paranavitana 1970, 09) "පරුමක පුශ කටිතය උපසික කටිතය ලෙනේ" (Paranavitana 1970, 22) ආදී වශයෙන් ශිලාලිපි වැඩි ප්‍රමාණයක් හමු වී ඇත. ඇතැම් අවස්ථාවල මව්වරුන් සිය පුතනුවන්ගේ